# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1972/37 - 2016 ජුනි මස 23 වැනි බ්‍රහස්පතින්දා - 2016.06.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### මධ්‍යම පළාතේ පළාත් සභාව

### මිණිපේ ප්‍රාදේශීය සභාව

### විනෝද බදු පැනවීම

(267 වැනි අධිකාරිය වූ) විනෝද බදු ආඥා පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව මිණිපේ ප්‍රාදේශීය සභාව විසින් සම්මත කරන ලද පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ (2) වැනි උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර මධ්‍යම පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද බව එකී උපවගන්තිය අනුව මෙයින් පළකරනු ලැබේ.

පී. බී. විජයරත්න,
ලේකම්,
ප්‍රධාන, අධ්‍යාපන හා පළාත් පාලන අමාත්‍යාංශය,
මධ්‍යම පළාත.

2016 ජුනි මස 04 වැනි දින,
පල්ලේකැලේ දී ය.

*යෝජනාව*

විනෝද බදු ආඥාපනතේ විස්තර කර ඇති යම් විනෝද කටයුත්තකට ඇතුළුවීම පිණිස කරනු ලබන ගෙවීමකින් (විනෝද බදු හැර) සියයට දහයක (10%) සමාන බද්දක් පනවා අයකළ යුතු යැයිද මෙම යෝජනා සම්මතය ගැසට් පත්‍රයේ පළකරන ලද මාසයට ඉක්බිතිව එළඹෙන මාසයේ පළමුවන දින සිට ක්‍රියාත්මක වියයුතු යැයිද යෝජනා කරන්නීය.

මෙම යෝජනා සම්මත ක්‍රියාත්මක වන පළමු දෙවසර ඇතුළත චිත්‍රපටයක් නැරඹීමට ගෙවනු ලබන ගාස්තුවක් මත අයකළ යුතු බදු මුදල එසේ ගෙවන ලද ගාස්තුවෙන් සියයට හතයි දශම පහක් (7.5%) විය යුතු යි.

07 - 406

1A - PG 2987 — 32 (2016/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*